ලංකා ධීවර වරාය නීතිගත සංස්ථාව - 2018

-----------------------------------------------------------

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 මතය වියාචනය

ලංකා ධීවර වරාය නීතිගත සංස්ථාවේ 2018 දෙසැම්බර් 31 දිනට මූල්‍යතත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ආදායම් ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත්කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

සංස්ථාවේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මම මතයක් ප්‍රකාශ නොකරමි. මතය වියාචනය සඳහා පදනම කොටසේ සාකච්ඡා කර ඇති කරුණු වල වැදගත්කම හේතුවෙන් මෙම මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් විගණන මතයක් සඳහා පදනමක් සැපයීමට ප්‍රමාණවත් හා උචිත විගණන සාක්ෂි ලබා ගැනීමට මා හට නොහැකි විය.

### 1.2 මතය වියාචනය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය වියාචනය කරනු ලැබේ. ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිතියටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. විගණන මතයක් සඳහා පදනමක් සැපයීමට ප්‍රමාණවත් සහ උචිත විගණන සාක්ෂි ලබා ගැනීමට නොහැකි විය.

### 1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමනාකරණයේ සහ පාලනය කරන සම්බන්ධ පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, සංස්ථාව අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය සංස්ථාව ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා සංස්ථාවේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

සංස්ථාවේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, සංස්ථාවේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යාම අවශ්‍ය කෙරේ.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

---

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතික වීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවිය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි බලපෑමක් විය හැකි බව අපේක්ෂා කෙරේ.

මා විසින් වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදි. තවද,

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් හඳුනාගැනීමේදී හා තක්සේරු කිරීමේදී අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීමෙන් වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවන්නා වූ අවදානම් මඟහරවා ගැනීමට, ප්‍රමාණවත් සහ සුදුසු විගණන සාක්ෂි ලබාගැනීම මාගේ මතයට පදනම් වේ. වරදක් නිසා සිදුවන බලපෑමට වඩා වංචාවක් හේතුවෙන් සිදුකරන ලද ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයක් හඳුනා නොගැනීම මගින් සිදුවන්නාවූ බලපෑම ප්‍රබල වන අතර, දුස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මඟහැරීම හෝ අභ්‍යන්තර පාලනයන් මඟහැරීම වංචාවක් ඇතිවීමට හේතුවේ.

- අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීම පිණිස සංස්ථාවේ අභ්‍යන්තර පාලනය සම්බන්ධයෙන් අවබෝධයක් ලබා ගන්නා ලද නමුත්, අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.

- කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය සහ යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල හා සම්බන්ධිත හෙළිදරව් කිරීම්වල සාධාරණත්වය අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් අධිකාරියේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාළත්වය තීරණය කරන ලදි. ප්‍රමාණවත් අවිනිශ්චිතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව් කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව් කිරීම ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතු වේ. මාගේ නිගමනයන් විගණකගේ වාර්තාවේ දිනය දක්වා ලබා ගන්නා ලද විගණන සාක්ෂි මත පදනම් වේ. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් විය හැකිය.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගණුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ සංස්ථාවේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ අධිකාරියේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, සංස්ථාව ක්‍රියාකර ඇති බව,
- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නිතීරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

## 1.5 මූල්‍ය ප්‍රකාශන

------------------

### 1.5.1 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම පිළිබඳ අභ්‍යන්තර පාලනය

----------------------------------------------------------------

ගණුදෙනු කළමනාකාරීත්වයේ පොදු සහ නිශ්චිත අධිකාරීබලය සහිතව ක්‍රියාත්මක කිරීම, අදාළ වන වාර්තාකරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට අවශ්‍ය වන පරිදි ගණුදෙනු සටහන් කිරීම සහ වත්කම් සඳහා ගිණුම් කටයුතුභාවය පවත්වාගෙන යාම, කළමනාකාරීත්වයේ පොදු සහ නිශ්චිත අධිකාරී බලය සහිතව පමණක් වත්කම්වලට ප්‍රවේශ වීම, සටහන් කරන ලද වත්කම් සඳහා වූ ගිණුම්කටයුතුභාවය පවත්නා වත්කම් සමඟ සාධාරණ කාල වකවානුවලදී සැසඳීම සහ වෙනස්කම් ඇතොත් ඒවා සම්බන්ධයෙන් නිසි පියවර ගැනීම ආදිය සඳහා සාධාරණ තහවුරුවක් ලබාගැනීමට ප්‍රමාණවත් "මනාලෙස සැලසුම් කරන ලද" අභ්‍යන්තර ගිණුම්කරණ පාලන පද්ධතියක් ආයතනය විසින් පවත්වාගෙන යාම සම්බන්ධ විගණන නිරීක්ෂණ පහත දැක්වේ.

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) මුදල් රෙගුලාසි 128(1)(ඇ)135(1) 139 සහ 140 (අ) ප්‍රකාර කල්පිටිය වරායේ ගෙවීම් වවුචර් 23 ක් මඟින් ගෙවීම් කළ රු.15,719,808ක් සම්බන්ධයෙන් ප්‍රමාණවත් අභ්‍යන්තර සෝදිසි ක්‍රමයක් පවත්වා නොයන බවට එම ක්‍රමයේ ක්‍රියාකාරීත්වය කලින් කළ සෝදිසිකර නොතිබූ අතර වවුචර් පිළියෙල කිරීම, මුදල් පොත ලිවීම ආදිය කම්කරු සේවකයකු වෙත පවරා තිබීම නිසා එකී වවුචර් නිර්දේශ කිරීම, අනුමත කිරීම, වියදම් සහතික කිරීම, එකම නිළධාරියෙකු විසින් සිදුකර තිබුණි. | කළමනාකරණය අදහස් දක්වා නොමැත. | මූල්‍ය බලතල බෙදාහැරීම නිවැරදිව සිදුකර අභ්‍යන්තර පාලනය ශක්තිමත් කර ගත යුතුය. |

| | | |
|---|---|---|
| (ආ) ධීවර වරායේ මූල්‍ය කටයුතු සම්බන්ධයෙන් ප්‍රමාණවත් අභ්‍යන්තර පාලන ක්‍රමයක් පවත්වාගෙන ගොස් නොතිබුණු බැවින් කල්පිටිය ධීවර වරායේ ඉන්ධන අලෙවිය පිළිබඳ භෞතික පරීක්ෂාවේදී ඉන්ධන පොම්පකරු විසින් දින 02 ක ඉන්ධන අලෙවියෙන් ලැබී තිබුණු ආදායම වූ රු.323,400 ක් වරායෙහි මුදල් අයකැමි වෙත භාර නොදී ඔහු සන්තකයේ තබාගෙන තිබුණු බව නිරීක්ෂණය විය. | ධීවර වරායන්හි ඉන්ධන අලෙවි කිරීමේදී ධීවර බෝට්ටු හිමියන් හා ඔවුන්ගේ කාර්ය මණ්ඩල ඉන්ධන සඳහා මුදල් ගෙවීමට කාර්යාලය වෙත ඒමට මැලිකමක් දක්වන අතර සෘජුවම අලෙවි හල වෙත මුදල් ලබා දී ඉන්ධන ලබා ගැනීමට පෙළඹේ. පසුව ධීවර සමිති සමඟ පවත්වන ලද සාකච්ඡාවලට අනුව වරාය කාර්යාලය වෙත ඉන්ධන මුදල් ලබා දීමට එකඟ කර ගන්නා ලදි. | මුදල් කටයුතු සම්බන්ධයෙන් අභ්‍යන්තර පාලන පද්ධති ක්‍රම හඳුන්වාදී දී ක්‍රියාත්මක කළ යුතුවේ. |

**1.5.2 ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතවලට අනුකූල නොවීම.**

---------------------------------------------------------------------

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2016 හා 2017 වර්ෂවල ඉදිකරන ලද රු. 8,325,121 ක් වූ වත්කම් සමාලෝචිත වර්ෂයේ ගිණුම්ගත කර තිබුණද , ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 03 හි 47හා 54 ඡේද ප්‍රකාරව කටයුතු කර පූර්ව වර්ෂයේ සංසන්ධනාත්මක තොරතුරු වලට ගලපා ඉදිරිපත් කර නොතිබුණි. | මූල්‍ය ප්‍රකාශනවල පූර්ව වර්ෂ සංසන්දනාත්මකව තොරතුරු නිවැරදි කිරීම, 2019 වර්ෂයේ ගිණුම් පිළියෙළ කිරීමේදී සිදු කිරීමට කටයුතු කරමි. | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතවලට අනුව සංසන්දනාත්මක තොරතුරු නිවැරදිව ගලපා මූල්‍ය ප්‍රකාශනවල දැක්විය යුතුය. |

**1.5.3 ගිණුම්කරණ ප්‍රතිපත්ති**

--------------------------

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) රු.30,209,500 ක් වූ වැලි කොට්ට යොදා සාදන ලද රළ කඩනයෙහි (Break Water) ඵලදායී ජීවකාලය කළුගලින් නිමවන ලද දියකඩනයෙහි ජීව කාලයට වඩා අඩු වුවත් එයද වසර 40 ක් ලෙස සලකා සමාලෝචිත වර්ෂය සඳහා ක්ෂය ප්‍රතිපාදනය කර තිබුණි | වැලි කොට්ට යොදා සාදන ලද රළ කඩනයෙහි ක්ෂය අනුපාතය වන 10% පදනම් කරගෙන අදාළ ක්ෂය ගණනය කර ජ'නල් සටහන් මඟින් නිවැරදි කිරීමට කටයුතු කරන ලදි. | වත්කම් වල ඵලදායී ජීවිත කාලය අනුව ක්ෂය වීම් සඳහා අවශ්‍ය ගිණුම්කරණ ප්‍රතිපත්ති හඳුන්වා දිය යුතුය. |
| (ආ) සංස්ථාවෙහි ගිණුම්කරණ ප්‍රතිපත්ති අනුව බදු දුන් දේපල එහි සාධාරණ අගයට මිනුම්කර, මූල්‍ය ප්‍රකාශනවල ඉදිරිපත් කරන බව දක්වා තිබුණද, සංස්ථාව විසින් බදු දුන් දේපල 87 ක සාධාරණ අගය තක්සේරුකර මූල්‍ය ප්‍රකාශනවල ඉදිරිපත් කර නොතිබුණු අතර මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබූ බදු දේපල වල විස්තරයන්හි අවම වශයෙන් පිරිවැය හෝ ඇතුලත් කර නොතිබුණි. | වත්කම් ප්‍රත්‍යාගණනයෙන් පසු එහි වටිනාකම් ඉදිරිපත් කිරීමට සටහන් කර ගතිමි. | වත්කම් වල සාධාරණ අගය තක්සේරු කර එම අගයන් මූල්‍ය ප්‍රකාශනවල ඉදිරිපත් කිරීමට කටයුතු කල යුතුය. |

## 1.5.4 ගිණුම්කරණ අඩුපාඩු

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ගොඩනැගිලි ඉදිකිරීම් කොන්ත්‍රාත් 03 ක වටිනාකම ගිණුම්ගත කිරීමේදී එකතුව රු. 8,157,552 ක් අඩුවෙන් ගිණුම්ගත කිරීම හේතුවෙන් සමාලෝචිත වර්ෂයේ දේපල පිරියත හා උපකරණවල වටිනාකම හා ඊට අදාළ ක්ෂය අඩුවෙන් දක්වා තිබුණි. | 2019 වර්ෂයේදී ප්‍රග්ධනත කිරීම සඳහා ජර්නල් සටහන් තබන ලදි. | ගොඩනැගිලි ඉදිකිරීම්වල නිවැරදි පිරිවැය ප්‍රාග්ධන ගත කළ යුතු වේ. |
| (ආ) | සමාලෝචිත වර්ෂයේ ස්ථාවර වත්කම් වලට අදාල ක්ෂය වියදම ලෙස රු. මිලියන 217ක් මූල්‍ය ප්‍රකාශන වල දක්වා තිබුණද , වත්කම් වලට අදාල ප්‍රමාණවත් වාර්තා නොතිබීම නිසා එක් එක් වත්කමෙහි ඵලදායී ජීවිත කාලය පදනම් කරගෙන ක්ෂය ගණනය කිරීම් සිදුකර නොතිබුණු බවට නිරීක්ෂණය විය. මෙම නිසා මූල්‍ය ප්‍රකාශන වල දක්වා ඇති ක්ෂය වියදමෙහි නිවැරදිභාවය විගණනයේදී පරීක්ෂා කිරීමට නොහැකි විය. | 2018 වර්ෂයේදී ධීවර ජනතාවගේ පාවිච්චියට යොදා ගෙන තිබූ බැවින් ප්‍රාග්ධනිත කර තිබූ අතර ඒ අනුව ක්ෂය වීම් ගලපන ලදී. | එක් එක් වත්කමේ ඵලදායී ජීවිත කාලය පදනම් කරගෙන ක්ෂය ගැලපීම් කල යුතුය. |
| (ඇ) | සමාලෝචිත වර්ෂයේ පාරිතෝෂික වෙන්කිරීම් රු.7,904,011 ක් අඩුවෙන් දක්වා තිබුණි. | සමාලෝචිත වර්ෂය තුළදි මුදලින් ගෙවූ පාරිතෝෂිත වටිනාකම රු. 7,927,252 ක් ලෙස දක්වා ගෙවීම් කරන ලද රු.113,071 ක් ප්‍රමාද දෝෂයකින් දූරකථන ගාස්තු ගිණුමට හර වී ඇත. | මූල්‍ය ප්‍රකාශන සමඟ ඉදිරිපත් කළ යුතු උපලේඛන නිවැරදිව ඉදිරිපත් කළ යුතු අතර ගිණුම් සංකේත අංකවල නිවැරදිතාවය වගකිව යුතු නිලධාරීන් විසින් පරීක්ෂා කළ යුතුය. |
| (ඈ) | වරායන්වල පවතින ඉන්ධන හා ලිහිසි තෙල් තොග දෙසැම්බර් 31 දිනට සත්‍යාපනය කර ලබා නොගෙන වරාය කළමනාකරුවන් ඉදිරිපත් කරන ලද රු.41,784,454 ක් වටිනාකම ගිණුම්වල ඉදිරිපත් කර තිබුණි. මේ හේතුවෙන් තොග ඌනතාවයන් හෝ අතිරික්තතාවයන් පිළිබඳ අනාවරණය කර ගැනීමට නොහැකි වී තිබුණි. | ඉන්ධන හා ලිහිසි තෙල් තොගයේ වෙනස්වීම් නැවත පරීක්ෂා කර නිවැරදි කිරීම සඳහා ජර්නල් සටහන් යොදන ලදි. | භෞතික තොග සත්‍යාපන ශේෂයට ගැලපීම් කර අවසන් තොගය මූල්‍ය ප්‍රකාශනවල දැක්විය යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ඉ) | අඩමාණ ණය ප්‍රතිපාදන රු.7,167,369 ක් අඩුවෙන් ප්‍රතිපාදනය කර තිබුණි. | පෙර වර්ෂවල අඩමාණ ණය වෙන් කිරිම වැඩියෙන් සිදු කර ඇති බැවින් එය සමාලෝචිත වර්ෂයේදි ජ'නල් අංක 393 මගින් ගැලපුම් කර ඇත. | අඩමාණ ණය වෙන්කිරීම පිළිබඳ නිවැරදි තොරතුරු ඉදිරිපත් කළ යුතුය. |
| (ඊ) | මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ කාරක ප්‍රාග්ධන වෙනස්වීම යටතේ මෝටර් රථ විකුණුම් ලාභය රු.8,760,918 ක් හා වෙළඳ ගෙවිය යුතු දැහි වෙනස්වීම රු.2,541,536 ක් වැඩියෙන් දැක්වීම හේතුවෙන් මෙහෙයුම් කටයුතු මුදල් ප්‍රවාහයේ රු.11,302,454 ක් වැඩියෙන් දක්වා තිබුණි. | 2019 වර්ෂයේ ගිණුම් පිළියෙල කිරීමේදී නිවැරදි කිරීමට සටහන් කර ගතිමි. | රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතවලට අනුකූලව මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සකස් කළ යුතුය. |
| (උ) | මුදල් ප්‍රවාහයේ ආයෝජන ක්‍රියාකාරකම් යටතේ මෝටර් රථ විකිණීමෙන් ලැබූ රු.5,910,918 ක් හා ස්ථාවර වත්කම් මිලදී ගැනීමට වැය කළ රු.1,854,793 ක් අඩුවෙන් දක්වා තිබුණි. | 2019 වර්ෂයේ ගිණුම් පිළියෙල කිරීමේදී නිවැරදි කිරීමට සටහන් කර ගතිමි. | රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතවලට අනුකූලව මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සකස් කළ යුතුය. |

### 1.5.5 විගණනය සඳහා ලිඛිත සාක්ෂි නොවීම.

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| මුළු වටිනාකම රු. 6,545,273,313 ක් වූ ස්ථාවර වත්කම් වර්ග 20 කට අදාල ස්ථාවර වත්කම් ලේඛන හා භාණ්ඩ සමීක්ෂණ වාර්තා, එකතුව රු. 26,646,026 ක් වූ වෙළඳ ණයගැති ශේෂයන් 04 කට අදාල, ණයගැති උපලේඛන, උපයෝගී ලියවිලි හා ශේෂ සනාථ කිරීම්, අමාත්‍යාංශ ප්‍රදාන යටතේ ප්‍රාග්ධනගත කර තිබුණු රජයේ හා විදේශාධාර මත ඉටුකර තිබුණු රු. 83,193,518 ක් වූ ප්‍රාග්ධනිත කළ වත්කම්වලට අදාල ප්‍රදාන ගිවිසුම් පිටපත් හා ඉටුකරන ලද කාර්යයන් පිළිබඳ විස්තර, ආසියානු සංවර්ධන බැංකුවෙන් ලැබීම යටතේ දැක්වෙන වසර 05 කට වැඩි කාලයක සිට පවතින රු.838,173,606 ක ශේෂ සකස් වූ ආකාරය දැක්වෙන උපලේඛන, එකතුව රු. 14,991,836 ක් වූ ණය හිමි ශේෂ 06කට අදාල සකස් වූ ආකාරය දැක්වෙන උපලේඛන හා රු.4,509,025 ක් වූ අනෙකුත් තැන්පතු හා රු.15,287,022 ක් වූ විශේෂ අත්තිකාරම් ශේෂයන් හා ලියාහැරිය යුතු ශේෂ වශයෙන් දක්වා ඇති රු.81,769,596 ක් සඳහා වූ උපලේඛන හා අනෙකුත් ලිඛිත සාක්ෂි විගණනයට ඉදිරිපත් නොකිරීම නිසා ඉහත දක්වා ඇති විෂයන් විගණනයේදී සතුටුදායක ලෙස සන්නිරීක්ෂණය කිරීමට නොහැකි විය. | ස්ථාවර වත්කම් ලේඛනය වත්කම් ප්‍රත්‍යාගණනය සමඟ ඉදිරිපත් කිරීමට කටයුතු කරමි. අනෙකුත් ශේෂ සඳහා කළමනාකරණයේ අදහස් දක්වා නොමැත. | මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබූ ගිණුම් ශේෂ සනාථ කිරීම සඳහා අවශ්‍ය ස්ථාවර වත්කම් ලේඛන හා භාණ්ඩ සමීක්ෂණ වාර්තා අනෙකුත් ලේඛන, ණයගැති උපලේඛන, උපයෝගී ලියවිලි හා ශේෂ සනාථ කිරීම් යනාදී ලිඛිත සාක්ෂි විගණනය වෙත ලබාදීමට කටයුතු කල යුතුය. |

**1.6 ලැබිය යුතු සහ ගෙවිය යුතු ගිණුම්**

**1.6.1 ලැබිය යුතු මුදල්**

| විගණන නිරීක්ෂණය | | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ණයගැති ශේෂ අතුරින් රු.44,825,023 ක් වූ ණයගැති ශේෂ වසර 02 ක සිට හා රු.141,779,477 ක ණයගැති ශේෂයක් වසර 05 ට වැඩි කාලයක සිට පියවා නොතිබුණි. | කළමනාකරණය අදහස් දක්වා නොමැත. | ණයගැති ශේෂ අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ආ) | සමාලෝචිත වර්ෂය අවසානයට පියවා නොතිබූ පෙර ගෙවීම් ශේෂය රු.36,659,355 ක් වූ අතර රු.34,744,302 ක එකතු ශේෂයක් වසර 05 ක සිට පියවා නොතිබුණි. | අදාළ පෙර ගෙවීම්වල විශාල ප්‍රමාණයේ අරමුණු ඉටු වී ඇතත් ඉන්වොයිස් හා ඒ ආශ්‍රිත ලියකියවිලි අස්ථානගත වී ඇත. 2019 වර්ෂයේදී අදාල කාර්යයන් නිම කිරීමට අපේක්ෂා කරමි. | පෙර ගෙවීම් නිරවුල් නොවීමට හේතු පරික්ෂා කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර තවදුරටත් වගකීමක් නොමැති ගෙවිය යුතු බවට මූල්‍ය ප්‍රකාශන වල දක්වා ඇති ශේෂයන් ආදායමට ලියා හැරීම සඳහා අවශ්‍ය පියවර ගත යුතුය. |

**1.7 නීතිරීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම.**

| | නීති රීති රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම<br>රු. | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| (අ) | 1957 අංක 49 දරන රාජ්‍ය කාර්මික නීතිගත සංස්ථා පනතේ 2 වන වගන්තිය හා මාර්තු 06 දිනැති ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අති විශේෂ ගැසට් පත්‍රය | ධීවරයන් වෙත ධීවර යාත්‍රා සඳහා අළුත්වැඩියා සහ නඩත්තු පහසුකම් සැපයීම සංස්ථාවේ එක් ප්‍රධාන අරමුණක් වුවද එම අරමුණ ඉටුකර ගැනීමට සංස්ථාව විසින් කටයුතු කර නොතිබුණි. | කළමනාකරණය අදහස් දක්වා නොමැත. | සංස්ථාවේ ප්‍රධාන අරමුණු ඉටුකර ගැනීම සඳහා අවශ්‍ය සියළුම කාර්යයන් කළ යුතුය. |

| | | | | |
|---|---|---|---|---|
| (ආ) | <u>ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි</u> | | | |
| (i) | මුදල් රෙගුලාසි 141 (ඉ) | හිස් චෙක්පත් 7 ක අත්සන් දෙකම සහ චෙක්පත් 6 ක දෙවන අත්සන පමණක් යොදා තිබුණි. | කළමනාකරණය අදහස් දක්වා නොමැත | මුදල් රෙගුලාසි අනුව කටයුතු කළ යුතුය. |
| (ii) | මුදල් රෙගුලාසි 454 | පොදු 44 වැනි ආකෘති පත්‍රය ප්‍රකාරව බඩු ලේඛන පොතක් පවත්වාගත යුතු වුවද, සංස්ථාවේ වරායන් 22 ක් ඇතුළුව ප්‍රධාන කාර්යාලයේ උප කාර්යාල සඳහා වටිනාකම රු.156,222,325 ක් වූ ගෘහභාණ්ඩ කාර්යාල උපකරණ සහ අනෙකුත් උපකරණ සඳහා බඩු ලේඛන පොතක් පවත්වාගෙන නොතිබුණි. | කළමනාකරණය අදහස් දක්වා නොමැත. | මුදල් රෙගුලාසි අනුව බඩු ලේඛන පොතක් පවත්වාගත යුතුය. |
| (iii) | මුදල් රෙගුලාසි 757 (2) | සමාලෝචිත වර්ෂයට අදාළ භාණ්ඩ සමීක්ෂණ වාර්තා විගණනය සඳහා ඉදිරිපත් කර නොතිබුණි. | කළමනාකරණය අදහස් දක්වා නොමැත. | මුදල් රෙගුලාසි අනුව භාණ්ඩ සමීක්ෂණ පවත්වා එහි පිටපත් විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කල යුතුය. |
| (ඇ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයේ V පරිච්ඡේදයේ 8.2 | සේවයෙන් පහකළ නිළධාරියෙකු යළිත් සේවයට නොගන්නා බවට දෙපාර්තමේන්තු ප්‍රධානියා වගබලා ගතයුතු වුවද, ඊට අනුකූල නොවී 2012 ජනවාරි 04 වන දින සිට මානව සම්පත් කළමනාකරණ තනතුර සඳහා රජයේ ආයතනයකින් විධිමත් විනය පරීක්ෂණයකින් සේවයෙන් ඉවත් කළ නිලධාරියෙකු බඳවාගෙන තිබුණි. විගණන වාර්තාවලින් පෙන්වා දී තිබුණද කළමනාකරණය මේ සම්බන්ධයෙන් අවධානය යොමුකර නොතිබුණි. | කළමනාකරණය අදහස් දක්වා නොමැත. | ආයතන සංග්‍රහයේ දැක්වෙන උපදෙස්වලට අනුව කටයුතු කළ යුතුය. |

| | | | | |
|---|---|---|---|---|
| (ඇ) | 2002 නොවැම්බර් 28 දිනැති අංක අයි/ඒ/අයි/2002/02 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය | පරිගණක හා පරිගණක උපාංග සම්බන්ධයෙන් ලේඛනයක් පවත්වා නොතිබුණි. | කළමනාකරණය අදහස් දක්වා නොමැත. | භාණ්ඩාගාර චක්‍රලේඛය අනුව පරිගණක හා උපාංග සඳහා වත්කම් ලේඛනයක් පවත්වාගත යුතුය. |
| (ඉ) | 2003 ජුනි 02 දිනැති අංක පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය | | | |
| | (i) 6.5.1 ඡේදය | මූල්‍ය වර්ෂය අවසන් වී දින 60 ක් තුළ මූල්‍ය ප්‍රකාශන විගණනය සඳහා ඉදිරිපත් කළ යුතු වුවද, සංස්ථාව විසින් සමාලෝචිත වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන දින 134 ක ප්‍රමාදයක් සහිතව 2019 ජුලි 12 දින ඉදිරිපත් කරන ලදි. තවද මූල්‍ය ප්‍රකාශන සමඟ කෙටුම්පත් වාර්ෂික වාර්තාව ඉදිරිපත් කර නොතිබුණි. | අධ්‍යක්ෂ මණ්ඩලය පත් කිරීම ප්‍රමාද වීම හේතුවෙන් මෙම මූල්‍ය ප්‍රකාශන නිසි වේලාවට ඉදිරිපත් කිරීමට නොහැකි වූ බව පිළිගනිමි. | රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය අනුව නියමිත දින හෝ ඊට පෙර මූල්‍ය ප්‍රකාශන විගණනය සඳහා ඉදිරිපත් කළ යුතුය. |
| | (ii) 9.7 ඡේදය | වැටුප් සංශෝධන සඳහා භාණ්ඩාගාර ලේකම්ගේ අනුමැතිය ලබානොගෙන මූල්‍ය කළමනාකාර තනතුර සඳහා වැටුප් වර්ධක 34 ක් ද, කණිෂ්ඨ කළමනාකරණ මට්ටමේ තනතුරක් වන පෞද්ගලික සහකාර තනතුර සඳහා පරිවාස කාලය ඉක්මවීමටත් පෙර වැටුප් වර්ධක 15 ක් ද එකවර පිරිනමා තිබුණු අතර අභ්‍යන්තර විගණක හා විගණන නිලධාරී තනතුරු ද නිවැරදි නොවන වැටුප් තලවල පිහිටුවීම සහ නීති නිලධාරිනියක් වෙත මසකට රු.10,000 බැගින් විශේෂ දීමනා ද ගෙවා තිබුණි. | කළමනාකරණය අදහස් දක්වා නොමැත. | වැටුප් වර්ධක ගෙවීම සඳහා භාණ්ඩාගාර ලේකම්ගේ අනුමැතිය ලබාගත යුතුය. අනුමැතියෙන් තොරව ගෙවන ලද ගෙවීම්, එකී ගෙවීමට අනුමැතිය දුන් සහතික කළ නිළධාරීන්ගෙන් අයකර ගත යුතුය. |
| (ඊ) | 2015 මැයි 25 දිනැති රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛ අංක 01/2015 හි 01 වන ඡේදය | ප්‍රවාහන දීමනා ලැබීමට හිමිකම් නොමැති MM 1-1 සහ JM 1-1 කාණ්ඩයේ නිලධාරීන් 36 දෙනෙකුට අධ්‍යක්ෂක මණ්ඩල අනුමැතිය මත එකතුව රු.3,024,000 ක් ප්‍රවාහන දීමනා සමාලෝචිත වර්ෂය තුළදී ගෙවීම් කර තිබුණි. | කළමනාකරණය අදහස් දක්වා නොමැත. | රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ දැක්වෙන උපදෙස් අනුව කටයුතු කළ යුතුය. |

| | | | | |
|---|---|---|---|---|
| (උ) | 2017 ඔක්තෝබර් 25 දිනැති කළමනාකරණ සේවා චක්‍රලේඛ අංක 05/2017 | රාජ්‍ය සංස්ථාවල ජ්‍යෙෂ්ඨ මට්ටමේ නිළධාරීන් සඳහා වෘත්තීය දීමනා ගෙවීම සඳහා විධිවිධාන පැහැදිලිව දක්වා තිබියදී ඊට පටහැනිව සංස්ථාව විසින් 2011 දෙසැම්බර් 12 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 28/2011 අදාල කරගනිමින් සංස්ථාවෙහි ඉංජිනේරුවන් 06 දෙනෙකුට මාසිකව රු.15,000 බැගින් සමාලෝචිත වර්ෂය තුළදී එකතුව රු.915,000 ක් වෘත්තීය දීමනා ගෙවා තිබුණි. | කළමනාකරණය අදහස් දක්වා නොමැත. | කළමනාකරණ සේවා චක්‍රලේඛය අනුව කටයුතු කළ යුතුය. |
| (ඌ) | 2018 ජුලි 18 දිනැති කළමනාකරණ සේවා චක්‍රලේඛ අංක 03/2018 හි (ii) | කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතිය ලබා නොගෙන සම්බන්ධීකරණ නිලධාරීන් 07 දෙනෙක් බඳවා ගෙන 2018 ජුනි සිට දෙසැම්බර් දක්වා වැටුප්, ව්‍යවස්ථාපිත අරමුදල් දායක ලෙස රු.2,053,935 ක් ගෙවා තිබුණි. සේවයට වාර්තා කළ බවට පැමිණීමේ සටහන් මඟින් තහවුරු කර ගෙන ද නොතිබුණි. | කළමනාකරණය අදහස් දක්වා නොමැත. | කළමනාකරණ සේවා චක්‍රලේඛයේ දැක්වෙන උපදෙස් අනුව කටයුතු කළ යුතුයි. |

**2. මූල්‍ය සමාලෝචනය**

**2.1 මූල්‍ය ප්‍රතිඵල**

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු. 2,696,534 ක අතිරික්තයක් වූ අතර ඊට අනුරූප ඉකුත් වර්ෂයේ ඌනතාවය රු. 64,601,644 ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලය රු. 67,298,178 ක වර්ධනයක් නිරීක්ෂණය විය. මෙම වර්ධනයට මෙහෙයුම් ආදායම් රු.87,835,292 කින් වැඩි වී තිබීම හා ආයතන පරිපාලන හා නඩත්තු වියදම් රු. 47,680,625 කින් අඩු වීම ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

**3. මෙහෙයුම් සමාලෝචනය**

**3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා**

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | හලාවත වරායේ දියකඩන ඉදිකිරීම් කොන්ත්‍රාත්තුව 2016 වර්ෂයේ මීටර් 50 ක දුරක් සඳහා වැලිකොට්ට | හලාවත මෝයකටෙහි පරීක්ෂණ මට්ටමින් ඉදිකරන ලද තාවකාලික දියකඩනය ඉදි කරමින් තිබියදී | ගිවිසුම අනුව කටයුතු කර සංස්ථාවට ලැබිය යුතු මුදල් අයකර |

| | | | |
|---|---|---|---|
| | තැන්පත් කිරීම සඳහා පෞද්ගලික ආයතනය සමඟ එළඹ තිබූ කොන්ත්‍රාත්තුව අධික රළ පහර හේතුවෙන් අතර මඟ නවතා දමා තිබුණි. මේ දක්වා ආයතනයට ගෙවීම් කරන ලද රු.1,079,280 ක් නිෂ්කාර්ය වියදමක් බවට පත්ව තිබුණි. | දෙසැම්බර් 11,12,13 යන දිනවල ඉන්දියාවට බලපෑ අධික සුළං තත්ත්වය ලංකාවට බලපෑම නිසා මෙම දියකඩනය කැඩී ඇත. | ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ආ) | ධීවර වරාය නීතිගත සංස්ථාව යටතේ වරායන් 21 ක් ක්‍රියාත්මක වන අතර, ඉන් වරායන් 16 ක ඉඩම් සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් විධිමත් පරිදි පවරා ගෙන නොතිබුණි. | කළමනාකරණය අදහස් දක්වා නොමැත. | වරාය ඉදිකිරීම සඳහා වෙන්කර දුන් ඉඩම් පවරාගෙන ගිණුම්ගත කිරීමට කටයුතු කළ යුතුය. |
| (ඇ) | සංස්ථාව විසින් මාසික බදුකුලිය තීරණය කිරීමේදී රජයේ තක්සේරුකරුගෙන් තක්සේරු වාර්තා ලබා නොගෙන අම්බලන්ගොඩ ධීවර වරායෙහි පර්චස් 40 ක භූමි ප්‍රමාණයක් මාසික බදු කුලිය රු.100,000 කට අයිස් යන්ත්‍රාගාරයක් ඉදිකර පවත්වාගෙන යාම සඳහා ද පර්චස් 04 ක භූමි ප්‍රමාණයක් මාසික බදුකුලිය රු.10,000 කට ලිහිසිතෙල් අලෙවිකිරීමේ වෙළඳසැලක් පවත්වාගෙන යාම සඳහා ද පෞද්ගලික සමාගමකට බදු දී තිබුණි. | කළමනාකරණය අදහස් දක්වා නොමැත. | රජයේ තක්සේරු වාර්තා ලබාගෙන ඒ අනුව සංස්ථාවේ ඉඩම් හා ගොඩනැගිලි බදු දීම කළ යුතුය. |
| (ඈ) | සංස්ථාවට අයත් සයුරි යාත්‍රාව ශ්‍රී ලංකා වරාය අධිකාරියට අයත් ඔලුවිල් ධීවර වරායෙහි කැණීම් කටයුතු සඳහා 2016 දෙසැම්බර් 16 දින සිට 2017 මාර්තු 09 තෙක් යොදවා තිබුණි. එසේ වුවත් මේ සඳහා ගිවිසුමක් ඇතිකරගෙන නොතිබුණු බැවින් මේ වෙනුවෙන් වරාය අධිකාරියෙන් සංස්ථාවට ලැබිය යුතු රු.24,840,000 ක මුදල අයකරගැනීමට නොහැකි වී තිබුණි. | කළමනාකරණය අදහස් දක්වා නොමැත. | සංස්ථාවට අයකරගත යුතු ආදායම් ලබාගැනීමට කළමනාකරණය වගකීමෙන් කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ඉ) | වටිනාකම රු.5,065,075 ක් වූ ඉන්ධන ටැංකි 06 ක් සැපයීම සඳහා 2007 වර්ෂයේදී රු. 2,791,215 ක අත්තිකාරම් ගෙවා තිබුණද එම ඉන්ධන ටැංකි සංස්ථාවට නොලැබීම පිළිබඳව ඊට වගකිව යුතු සැපයුම් කළමනාකරුට එරෙහිව කටයුතු කිරීමට උපදෙස් දී තිබුණි. එකී උපදෙස් අනුගමනය කර නොතිබුණි. සැපයුම් කළමනාකරු නැවත තනතුරේ පිහිටුවා විශ්‍රාම ගන්වා තිබුණද සිදු වූ අලාභ අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | කළමනාකරණය අදහස් දක්වා නොමැත. | වගකිවයුතු නිළධාරීන්ගෙන් අලාභ අය කර ගැනීමට කළමනාකරණය කටයුතු කළ යුතුය. |
| (ඊ) | ධීවර වරායන් 04 ක් සඳහා ටොන් 40 ක ධාරිතාවය සහිත පාලම් තරාදි 04 ක් මිළදී ගැනීම හා සවිකිරීම සඳහා 2016 දෙසැම්බර් 23 දින පෞද්ගලික සමාගමකට රු.7,478,260 කට (VAT රහිත) ටෙන්ඩරය ප්‍රදානය කර තිබුණි. ගිවිසුම ප්‍රකාරව දින 121 කින් නිම කළ යුතු වුවත්, 2019 පෙබරවාරි වන විටත් නිමකර නොතිබියදී 2017 පෙබරවාරි 06 දින සහ 2017 මැයි 05 දින එකතුව රු.4,650,000 ක් කිසිදු බැංකු සුරක්ෂණයක් ලබාගැනීමෙන් තොරව සැපයුම්කරුට ගෙවා තිබුණි. | පාලම් තරාදි ස්ථාපිත කිරීමේදී ධීවර ප්‍රජාවගේ විවිධ වූ බාධාවන් එල්ල වන අතර එම බාධාවන් විසඳා ගැනීමට ධීවර සමුළු සමඟ වාර කිහිපයක් සාකච්ඡා කිරීම හේතුවෙන් ඒවා ස්ථාපිත කිරීමට කල් ගත වී ඇත. | රජයේ නීති රීති අනුගමනය නොකර සිදුකරන අලාභ සම්බන්ධයෙන් වගකිව යුතු නිලධාරීන් හඳුනාගෙන ඉදිරි පියවර ගැනීම කළමනාකරණයේ වගකීම වේ. |
| (උ) | 2016 හා 2017 වර්ෂවල මාගේ වාර්තාවෙන් පෙන්වා දුන් රු. 1,103,979 ක් වූ ගිණුම්කරණ අඩුපාඩු දෙකක් සමාලෝචිත වර්ෂය වන විටත් නිවැරදිකර නොතිබුණි. | රු.373,979 ක් අඩුවෙන් ප්‍රාග්ධනිතවීම සමාලෝචිත වර්ෂයේදී ජර්නල් වවුචරයක් මගින් නිවැරදි කර ඇත. රු.730,000 ක් වූ දේශීය හා විදේශීය පුහුණු වියදම් ඵලදායී ජීවිතකාලයටම බලපාන බැවින් ප්‍රාග්ධනිත කරන ලදී. | පෙන්වා දුන් අඩුපාඩු නිවැරදි කර ඒ පිළිබඳ විගණනයට වාර්තා කළ යුතුය. |

**3.2 මෙහෙයුම් අකාර්යක්ෂමතා**

--------------------------------

| විගණන නිරීක්ෂණය | | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2014 වර්ෂයට පෙර මුළු මෙහෙයුම් ලාභයෙන් සියයට 73 ක් ඉපැයූ මෝදර ධීවර වරාය, 2014 ඔක්තෝබර් 30 දින සිට වසර 25 ක කාලයක් සඳහා පෞද්ගලික තක්සේරුකරුවකුගේ තක්සේරු වටිනාකම පදනම් කරගෙන රු.125,000 ක මාසික කුලියකට පෞද්ගලික ආයතනයකට බදු දී තිබුණි. ඉන් පසු සංස්ථාව සහ කල්බදු ගැනුම්කරු අතර 2015 ජුනි 10 දින ඇතිකර ගත් අතිරේක ගිවිසුමෙහි කොන්දේසි අංක 03 අනුව රජයේ තක්සේරුකරුගේ මාසික බදුකුලිය වන රු.1,700,000 ක් අයකරන බවට එකඟ වී තිබුණද ,එම තක්සේරු වටිනාකමට වරාය බේසම ඇතුලත් කර නොතිබුණි. රජයේ තක්සේරුකරුගේ මාසික බදුකුලිය අය නොකිරීම හේතුවෙන් සමාලෝචිත වර්ෂය අවසාන වන විට රු. 63,228,776 ක බදු ආදායමක් සහ දැනට පවතින ගිවිසුම් අනුව අයකරනු ලබන මාසික කල්බදු කුලිය සහ නැංගුරම් ගාස්තු අනුව 2018 දෙසැම්බර් 31 දිනට රු. 1,720,030 ක් සංස්ථාවට ලැබිය යුතුව තිබුණි. | කළමනාකරණය අදහස් දක්වා නොමැත. | රජයේ දේපල පවතින ආර්ථික බදු කුලිය මත බදු දීමට කටයුතු කර රජයට ලැබිය යුතු උපරිම ආදායම දේපල වලින් උපයා ගැනීමට කටයුතු කල යුතුය. එසේම ලැබිය යුතු හිඟ ආදායම් නොපමාව අයකර ගැනීමට අවශ්‍ය කඩිනම් පියවර කළමනාකරණය විසින් ගත යුතුය. |
| (ආ) | සංස්ථාව යටතේ ක්‍රියාත්මක වන ධීවර වරායන් 20 න් වරායන් 15 ක්ම සමාලෝචිත වර්ෂය තුළ රු.168,539,219 ක මෙහෙයුම් අලාභ ලබා තිබූ අතර, ඉන් වරායන් 14 ක් ඉකුත් වර්ෂයේදී ද අලාභ ලබා තිබුණි. අලාභ ලබන වරායන්වල අලාභ ලැබීමට හේතූන් අධ්‍යයනය කර ලාභ ලබන තත්ත්වයකට ගෙන ඒමට කළමනාකරණයේ අවධානය යොමු වී නොතිබුණි. | කළමනාකරණය අදහස් දක්වා නොමැත. | වියදම් අවම කරගෙන ලැබිය යුතු ආදායම් අයකරගෙන අලාභ ලබන වරායන් ලාභ ලබන තත්ත්වයට පත් කර ගැනීමට කළමනාකරණය කටයුතු කළ යුතුය. |

**3.3 මතභේදයට තුඩුදෙන ගණුදෙනු**

| විගණන නිරීක්ෂණය | | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | පානදුර වරායේ වැලි ඉවත් කිරීම සඳහා අනුමැතියකින් තොරව 2014 වර්ෂයේදී පෞද්ගලික සමාගමක් සමඟ ගිවිසුම්ගතවී ඇප සුරක්ෂණයක්ද ලබාගැනීමකින් තොරව රු.20,000,000 ක අත්තිකාරම් මුදලක් එම සමාගමට ලබා දී තිබුණි. 2015 දෙසැම්බර් 10 දිනැති අතිරේක ගිවිසුමෙහි කොන්දේසි අනුව පෞද්ගලික සමාගම විසින් කැණීම් කරන ලද වැලි විකුණා ලැබෙන මුදලින් අත්තිකාරම් මුදල හිලව් කළ යුතු වුවද, සමාලෝචිත වර්ෂය අවසානය දක්වා එකී මුදල් අයකරගෙන නොතිබුණි. | කළමනාකරණය විසින් අදහස් දක්වා නොතිබුණි. | රජයේ පවත්නා නීතිරීතිවලට අනුව කටයුතු නොකිරීමෙන් සිදුවන පාඩු වගකිවයුතු නිලධාරීන්ගෙන් අයකිරීමට කටයුතු කළ යුතු වේ. අවශ්‍ය පද්ධති හා පාලන ක්‍රම හඳුන්වා දී ක්‍රියාත්මක කිරීම ද කළ යුතු වේ. |
| (ආ) | 2013 දෙසැම්බර් 29 දිනැති ගිවිසුම් ප්‍රකාරව කොඩ්බේ ධීවර වරාය සතු ටොන් 100 ක දියත් මඟ, සේවක නේවාසිකාගාරය සහ යාන්ත්‍රික වැඩපල මාස 06 ක් තුළ අලුත්වැඩියා කර භාවිතා කිරීම සඳහා පෞද්ගලික පාර්ශවයකට බදු පදනම මත භාරදී තිබුණි. විගණිත දිනය වන 2018 අගෝස්තු 30 දිනට වසර 4 ½ ක කාලයක් ඉක්මවා තිබුණද, දියත් මඟ වැඩිදියුණු කිරීමේ මූලික අරමුණ ඉටුවී නොතිබියදී ඉකුත් වර්ෂය අවසාන වන විට බදු ගැණුම්කරුගෙන් රු.1,690,500 ක් වූ බදු මුදල අයකර ගැනීමට සංස්ථාව කටයුතු කර නොතිබුණි. | හිඟ බදු ආදායම් අයකර ගැනීම සඳහා ගිවිසුම් ප්‍රකාරව නීතිමය කටයුතු සලසා ඇත. | බදු කුලී අයකර ගැනීමට කළමනාකරණයේ වගකීම වේ. |

## 3.4 ප්‍රසම්පාදන කළමනාකරණය

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ධීවර වරායන් 06 කට ඉන්ධන ටැංකි සපයා සවි කිරීමට පෞද්ගලික ආයතනයක් සමඟ රු.11,363,000 කට එකඟ වී තිබුණි. නියමිත කාලයට වඩා දින 506 ක් ප්‍රමාද වී තිබුණද, ඉන්ධන ටැංකි සවි කිරීම එකඟ වූ පරිදි නිම කර නොතිබුණි. | කළමනාකරණය අදහස් දක්වා නොමැත | කොන්ත්‍රාත්තුව අවසන් වීමට පෙර අත්තිකාරම් බැඳුම්කරය අළුත්කර නොගැනීමෙන්, ප්‍රමාද කාලය සඳහා ගිවිසුම් ප්‍රකාර ප්‍රමාද ගාස්තු අය නොකිරීම සහ ටැංකි විධිමත්ව සවි නොකිරීම සම්බන්ධයෙන් ඉදිරි පියවර ගත යුතුය. |
| (ආ) | ධීවර වරායන් 08 ක් සඳහා ඉන්ධන පොම්ප 08 ක් රු. 19,121,000 කට මිලදී ගැනීමේ කොන්ත්‍රාත්තුව 2016 නොවැම්බර් 22 දින ප්‍රදානය කර තිබුණි. තාක්ෂණික පිරිවිතරය අනුව පොම්පවල ධාරිතාවය මිනිත්තුවට ලීටර් 150 ක් විය යුතු වුවද, සපයන ලද ඉන්ධන පොම්පවල ධාරිතාවය මිනිත්තුවට ලීටර් 138ක් විය. සංස්ථාවේ අවශ්‍යතාවයට නොගැලපෙන ඉන්ධන පොම්ප සැපයුම්කරු විසින් සපයා තිබීම හා වරායන් තුළ ස්ථාපිතකර තිබූ ඉන්ධන පොම්ප 2019 මාර්තු 11 දින වන විට භාවිත නොකිරීම හේතුවෙන් සැපයුම්කරුට ගෙවූ රු. 3,824,200 ක් නිෂ්කාර්ය වියදමක් වී තිබුණි. තවද, එකඟ වූ පරිදි භාණ්ඩ නොසැපයීම සම්බන්ධයෙන් අවශ්‍ය ක්‍රියාමාර්ග ද ගෙන නොතිබුණි. | ඉන්ධන පොම්ප සඳහා අදාල තාක්ෂණික පිරිවිතරයන් වල පැවති අඩුලුහුඩුතා හේතුවෙන් ඉන්ධන පොම්ප මිලදී ගැනීමේ ක්‍රියාවලිය නවතා දමන ලද අතර ඉන්ධන පොම්ප සැපයුම්කරු විසින් ස්ථාපිත කරන ලද්දේ අදාල පිරිවිතරයෙන් බැහැරව එම ආයතනය විසින් ලංසු කැඳවීම සමඟ ඉදිරිපත් කරන ලද පිරිවිතරයන් සමඟ සැසඳීමේදී අනාවරණය විය. කාර්ය සාධන බැඳුම්කරය දීර්ඝ කර ගැනීම සඳහා ඉල්ලීම් කළ අතර ඒ වන විට ඉන්ධන පොම්ප කිහිපයක් වරායේ ස්ථාපිත කර තිබුණි. එම ඉන්ධන බෙදාහැරීමේ පොම්ප පරීක්ෂා කරන අතරතුරදී මෙම කාර්යසාධන බැඳුම්කරය කල් ඉකුත් විය. | සංස්ථාවේ අවශ්‍යතාවයට අනුකූලව මිලදී ගැනීම් කළ යුතුයි. මේ සම්බන්ධයෙන් වගකිව යුතු නිලධාරීන් හඳුනාගෙන ඉදිරි පියවර ගත යුතුවේ. |

### 3.5 කොන්ත්‍රාත් පරිපාලනයේ අඩුපාඩු

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) ධිවර වරාය නීතිගත සංස්ථාවේ කාර්යාල ගොඩනැගිල්ල ඉදිකිරීම මාස 06 කින් අවසන් කර භාරදීම සඳහා 2017 අගෝස්තු 29 දින රු.18,223,081 ක ගිවිසුම අත්සන් කර තිබුණි. 2019 ජූනි 30 දින දක්වාම වැඩ අවසන් කර භාර නොදීම හේතුවෙන් ගිවිසුමේ 17 වගන්තිය ප්‍රකාරව අයකළ යුතු ප්‍රමාද ගාස්තු රු.1,876,969 ක් අයකර නොතිබුණි.<br>රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ විධිවිධානවලට අනුකූල නොවී තිබියදී රු. 16,180,537 ක් උක්ත ගොඩනැගිල්ල ඉදිකිරීම සඳහා ගෙවා තිබුණි. | ගිවිසුමේ 18 වන වගන්තිය ප්‍රකාරව අදාල කොන්ත්‍රාත්තුව නියමිත කාලය තුල නිම කිරීමට නොහැකි වැඩ වෙනුවෙන් අතිරේක දිනයන් සඳහා 0.5% ක් ලෙස වෙන් කර තිබුණි. | රජයේ නීති රීති අනුගමනය නොකර සිදුකරනු ලබන අලාභ සම්බන්ධයෙන් වගකිව යුතු නිලධාරීන් හඳුනාගෙන ඉදිරි පියවර ගැනීම කළමනාකරණයේ වගකීම වේ. |
| (ආ) හලාවත දියකඩනය අදියර 4 ක් යටතේ ඉදිකිරීමට රු.මිලියන 16.5 ක කොන්ත්‍රාත්තුව ප්‍රදානය කර තිබූ ආයතනය ඉදිකිරීම් පුහුණු හා සංවර්ධන ආයතනයේ ලියාපදිංචි වී නොතිබුණු අතර වෙනත් ආයතනයක ලියාපදිංචිය ඉදිරිපත් කර තිබුණද, තාක්ෂණික ඇගයීම් කමිටුව ලියාපදිංචිය තහවුරු කර නොගෙන කොන්ත්‍රාත් ප්‍රදානය කර තිබුණි. | CIDA ශ්‍රේණිය පදනම් කරගෙන මෙම කොන්ත්‍රාත්තුව ලබා දී ඇත. | තාක්ෂණික ඇගයීම් කමිටුව විසින් කොන්ත්‍රාත්කරුවන්ගේ සුදුසුකම් පරීක්ෂා කර ඒ පිළිබඳ ටෙන්ඩර් මණ්ඩලය වෙත වාර්තා කිරීමට කටයුතු කළ යුතුය. |

### 3.6 වෙනත් සංවිධානවලට මුදාහළ සම්පත්

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සංස්ථාව විසින් රේඛීය අමාත්‍යාංශය සහ වෙනත් රජයේ ආයතනවලට සංස්ථාවේ සේවකයන් 18 දෙනෙකු නිදහස්කර සමාලෝචිත වර්ෂයේදී වැටුප් හා දීමනා ලෙස රු. 10,405,318 ක් ගෙවා තිබුණි. | අමාත්‍යාංශය වෙත නිදහස් කර ඇති සේවකයන් අතරින් කොටසක් නැවත අප ආයතනය වෙත ගෙන්වා ඇති අතර, තවත් සුළු පිරිසක් එයට අනුයුක්තව සේවය කරනු ලබයි. මේ පිරිස ද ඉදිරියේදී සංස්ථාවට කැඳවීමට නියමිතව ඇති බව දන්වා ඇත. | 2003 ජූනි 02 දිනැති රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛ අංක 12 හි දැක්වෙන උපදෙස්වලට අනුකූලව කටයුතු නොකළ නිලධාරීන් හඳුනාගෙන නීතිමය පියවර ගත යුතුය. |

## 3.7 මානව සම්පත් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2007 උපදේශන සේවා ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රයෙහි 04 වන පරිච්ඡේදයෙහි උපදේශන සේවා සඳහා උපදේශකවරයෙකු බඳවා ගැනීමට අවශ්‍ය විධිවිධානවලට පටහැනිව සහ කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතියකින් තොරව සංස්ථාව විසින් 2018 අගෝස්තු සිට 2018 සැප්තැම්බර් දක්වා සංස්ථාවෙහි කළමනාකරණ අධ්‍යක්ෂකවරයා 2018 සැප්තැම්බර් සිට වසරක කාල පරිච්ඡේදයක් සඳහා පත් කර තිබුණි. එදින සිට නිත්‍ය තනතුරේ වැටුපට අමතරව 2018 දෙසැම්බර් දක්වා මාසික දීමනා හා ජීවන දීමනා වශයෙන් රු.370,113 ක් ගෙවා තිබුණු අතර කිසිදු උපදේශන වාර්තාවක් ලබා දී නොතිබුණි. | 2013 ජනවාරි 17 වන දිනට අනුමත සේවක අවශ්‍යතා ලේඛනය සඳහා අනුමැතිය ලබා දීමේදී එවකට ආයතනයේ සේවය කළ සියළුම සේවක මහතුන් එම අවශ්‍යතා ලේඛනයට අන්තර්ගත නොවීම හේතුවෙන් මෙලෙස අතිරික්ත සේවකයන් ලෙස පෙන්නුම් කරනු ලබයි. | රජයේ නීති රීති අනුගමනය නොකර සිදුකර අලාභ සම්බන්ධයෙන් වගකිව යුතු නිලධාරීන් හඳුනාගෙන නීතිමය පියවර ගැනීම කළමනාකරණයේ වගකීම වේ. |
| (ආ) | සංස්ථාවෙහි 2018 දෙසැම්බර් 31 දිනට අනුමත කාර්ය මණ්ඩලයට වඩා අතිරික්තව 284 ක් ද කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව විසින් අනුමත කළ තනතුරුවලට පරිබාහිරව ඇතිකරගත් තනතුරු 22 කට සේවකයන් 204 ක් ද බඳවා ගෙන තිබුණි. | කළමනාකාරීත්වය අදහස් දක්වා නොමැත. | කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමත තනතුරු සඳහා පමණක් නිලධාරීන් බඳවා ගැනීම් කළ යුතුය. |
| (ඇ) | 2007 වර්ෂයේදී නිකුත් කළ අභ්‍යන්තර විගණන වාර්තාවකට අනුව සැපයුම් අංශයෙහි රාජකාරී කටයුතු භාරව සිටියදී රජයේ මුදල් අවභාවිතා කිරීමට සම්බන්ධ ලිපිකරු නිලධාරිණියකගෙන් රජයට සිදුවූ පාඩුව අයකර ගැනීමකින් හා විනය පරීක්ෂණයකින් තොරව 2014 මැයි 05 සිට ඇය නැවත එම අංශයටම අනුයුක්ත කර තිබුණි. | කළමනාකාරීත්වය අදහස් දක්වා නොමැත. | රජයේ මුදල් අවභාවිත කළ නිලධාරීන් සම්බන්ධයෙන් පවත්නා නීතිරීතිවලට අනුව කටයුතු කළ යුතුය. |

**4. ගිණුම්කටයුතුභාවය සහ යහපාලනය**

**4.1 විගණන කමිටුව**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| 2003 ජුනි 02 දිනැති අංක පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 7.4.1 ඡේදය ප්‍රකාරව මාස තුනකට වරක් විගණන කමිටු රැස්වීමක් පැවැත්විය යුතු අතර වර්ෂයකට අවම වශයෙන් රැස්වීම් හතරක්වත් පැවැත්විය යුතු වුවද, ඒ අනුව කටයුතු කර නොතිබුණි. සමාලෝචිත වර්ෂයේ රැස්වීම් වාර 3 ක් පමණක් පවත්වා තිබූ අතර පසුගිය කමිටු තීරණ ක්‍රියාත්මක කිරීම හා පසු විපරම් කිරීම දුර්වල මට්ටමක පැවතුණි. | කළමනාකාරීත්වය අදහස් දක්වා නොමැත. | චක්‍රලේඛ උපදෙස් අනුව කටයුතු කළ යුතුයි. |